# පනස්හයේ දරුවෝ

මෙයට අවුරුදු දහසයකට පෙර 1989 සැප්තැම්බර් 26 වැනි දා පළමු බණ්ඩාරනායක සමරු දේශනය පැවැත්වීමේ අවස්ථාව මට උදාවිය. එකල රටේ පැවතියේ මහා භීෂණයකි. ජ වි පෙරමුණට විරුද්ධ ව රජය මෙන් ම ප්‍රා වැනි වෙනත් සංවිධාන ද ක්‍රියාත්මක විය. ජ වි පෙ සමග සාකච්ඡා පැවැත්විය යුතු යැයි කී සාමදූතයෝ එදා නො සිටියහ. ඒ වෙනුවට ජ වි පෙ මර්දනයකිරීමට ඔවුහු ආයුධ අතට ගත්හ. එදා මාක්ස්වාදී ස්ථාවරයක පිහිටා ජ වි පෙ ක්‍රියාකළ ආකාරය මුළුමනින් ම නිවැරදි නො වී ය. 1987 දී ම ඒ බව පෙන්වාදීමට හැකිවිය. එදා ඒ ජා ප ආණ්ඩුවේ මෙන් ම ජ වි පෙරමුණේ ද තර්ජනයට මම ලක්වීමි. එකල කොළඹ විශ්වවිද්‍යාලයෙහි  ජ වි පෙ දේශපාලනයක් මෙන්ම ජ වි පෙ විරෝධී දේශපාලනයක් ද, ජාතික දේශපාලනයක් ද විය.  කොළඹ විශ්වවිද්‍යාලය ජාතික දේශපාලනයෙහි මධ්‍යස්ථානය බඳු විය. භීෂණයෙන් පසුව විශ්ව විද්‍යාල නැවත විවෘතකිරීමෙන් පසු කොළඹ විශ්වවිද්‍යාලයේ බලයට පත්වූයේ ජාතික දේශපාලනයක් පිළිගත් කණ්ඩායම ය. එක් අතකින් ගත්කල සුළු කාලයක් හෝ කොළඹ විශ්වවිද්‍යාලය රටේ දේශපාලනයෙහි පෙරගමන්කරුවා විය. එහෙත් විවිධ හේතුන් නිසා ටික කලකින් ම කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජාතික දේශපාලනය පරාජයට පත්විය. ජාතික දේශපාලනයට හතරවටින් පහර දෙන්නට විය. ලේක්හවුස් පත්තර ගොන්න ඉතිහාසය පුරා කර ඇති දේ නැවතත් කරමින් ජාතිකත්වයට පහර පිට පහර දුනි. තුට්ටු දෙකේ ලිබරල්වාදියෝ හා කසිකබල් මාක්ස්වාදියෝ ජාතිකත්වයට එරෙහිව සිළුමිණ හා සන්ඩේ ඔබ්සර්වර් පුවත්පත්වල අත්වැල් බැඳගත්හ. අනුරුද්ධ තිලකසිරිලා ලේක්හවුසියෙන් ජනිතවූහ. එහි දී ජාතිකත්වය වෙනුවෙන් සිළුමිණට ලිවීමට පෙරට වැඩියේ පනස්හයේ ජාතික බලවේගයට නායකත්වය දුන් හිමිනමක් වූ බද්දේගම විමලවංශ නායක හිමියන් ය. මේ ප්‍රහාරය කෙතරම් දැඩි වීද යැයි කිවහොත් වීරයන් සේ පෙනී සිටිය ද, තම එකහමාර බේරාගනු රිසි අපේ ම  ඇතැම්හු ජාතික චින්තනය කතානොකර සිටින්නැයි අපට අවවාද දුන්හ. අපි ඒ අවස්ථාවාදී දීන අවවාදවලට කන් නො දුන්නෙමු. අවවාද දුන්නෝ පසුව වෙනම බයිලාවක් කීහ. දේශපාලනයෙහි දී ජය මෙන් ම පරාජය ද වැදගත් වෙයි.  කොළඹ විශ්වවිද්‍යාලයේ සිද්ධිවලින් ජාතික දේශපාලනය ඉගෙනගත් පාඩම් රාශියක් වෙයි.

1989 බණ්ඩාරනායක සමරු දේශනයෙහි මාතෘකාව ලෙස මා තෝරාගත්තේ පනස්හයේ දරුවෝ යන්න ය. ඒ දේශනයෙහි දී මම එයට නිර්වචනයක් දුන්නෙමි. ඒ නිර්වචනයට අනුව පනස්හයේ දී අවුරුදු දොළහට පමණ අඩු වූ හෝ පනස්හයෙන් පසුව උපත ලැබුවා වූ හෝ අයගෙන් පනස්හයේ පෙරළියෙන් යම් ආභාසයක්, උත්තේජනයක් ලැබුවෝ පනස්හයේ දරුවෝ වූහ. ජ වි පෙරමුණේ බොහෝ දෙනා ඒ නිර්වචනයට අනුව පනස්හයේ දරුවෝ වෙති. එහෙත් ඉන් කියැවෙන්නේ පනස්හයේ දරුවන් ඇත්තේ ජ වි පෙරමුණේ පමනක් ය යන්න නො වෙයි. පනස්හයේ දරුවෝ ඉතා වැඩි දෙනෙක් ශ්‍රී ල නි පක්ෂයේ වෙති. ඔවුහු මහජන එක්සත් පෙරමුණේ ද ජාතික හෙළ උරුමයේ ද වෙති. 1987- 89 ජ වි පෙ දේශපාලනය, ජ වි පෙ සාමාජිකයන් හා ශ්‍රී ල නි ප සාමාජිකයන් අතර තිබූ ලේ නෑකම හඳුනාගැනීමට  බාධාවක් නො වී ය. කෙදිනක හෝ ජ වි පෙ, ම එ පෙ හා ශ්‍රී ල නි ප එකම වේදිකාවක දැකගතහැකිවේ යැයි 1989 දී කී දෙනකු සිතන්නට ඇත් දැයි මම නො දනිමි. එහෙත් ඉන් අවුරුදු පහළොවකට පමණ පසු ඒ පක්ෂවල පරිවාස ආණ්ඩුවක් බිහිවිය. ඉන් අවුරුදු දහසයකට පසු අද පනස්හයේ දරුවෝ වැඩි දෙනෙක් එකම වේදිකාවේ වෙති. පනස්හයේ දරුවකු වූ මට වඩා ඒ පිළිබඳ ව සතුටුවන වෙනත් පනස්හයේ දරුවන් ඇතොත් ඒ ඉතා ටික දෙනකු විය යුතු ය. එහෙත් මෙයින් කියැවෙන්නේ මේ සංධාන දිගින් දිගටට ම නො කැඩී පැවැත්වෙන්නේ ය යන්න නො වේ. ඇතැමුන් අද හෙටම කැඩෙන්නට ද හැකි ය. එසේ කැඩීම් වෙන්වීම් තිබුණ ද  වැදගත්වන්නේ නෑකම හඳුනාගැනීම ය. අද මේ සියල්ලෝ ම ජාතික බලවේගයේ කොටස් ලෙස පෙනී සිටිති. ජාතික දේශපාලනය කොළඹ විශ්වවියාලයේ දී පරාජය වූයේ නිල වශයෙන් පමණ ය. ජාතික දේශපාලනයේ මතවාදය (මතවාද හා ඊනියා දැනුම අතර වෙනසක් නැති බව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ වහළුන්ට නැවත නැවතත් මතක්කිරීමට සිදුවෙයි.) අද රටපුරා ජයගෙන ඇත. අඩුම තරමින් මැතිවරණ සමයේ දී ජාතිකත්වයට ගරුකිරීමට අද ඊනියා රාජ්‍ය නොවන සංවිධානවල කසිකබල් උගතුන්ට,  පුස්කෑ ට්‍රොට්ස්කිවාදීන් කිහිප දෙනකුට හා සිංහල විරෝධී මහජන පක්ෂයේ පැරණි සාමාජිකාවකට හැරෙන්නට ක්‍රියාකාරී දේශපාලනයෙහි යෙදෙන්නන්ට සිදුවෙයි.  එහෙත් ලේක්හවුසියේ තුට්ටු දෙකේ ජනමාධ්‍යවේදීන්ට නම් ජාතික චින්තනය යනු පටු මතවාදයකි. මොවුන්ගේ පළල් මතවාදයේ දිග පළල ඇත්තේ ලංඩනයේ හා පැරිසියේ කෞතුකාගාරවල ය. අඩුම තරමින් මගේ ලෝකය, මාක්ස්වාදයේ දරිද්‍රතාවය, අපෝහකයේ රූපිකය, විද්‍යා කතන්දර පොත් කියවා තේරුම් නොගතහොත් වැඩිකල් නොගොස්ම ඔවුන් ද කෞතුකාගාර වස්තු

© Prof. Nalin De Silva

බවට පත්වනු ඇත. තමන් නූතනත්ව පොරවල් කියා සිතුව ද කූන්ගේ සුසමාදර්ශයවත් (පැරඩයිමවත්) හරිහැටි නොතේරෙන මේ බැළයන්ට චින්තන සංකල්පය දුරාවබෝධවීම පුදුමයක් නො වෙයි.

පනස්හයේ පෙරළියට ලබන වසරේ අවුරුදු පනහක් පිරෙයි. අප එය උත්සවශ්‍රීයෙන් සැමරිය යුතු ය. පනස්හය යනු අළුයට සැඟවී තිබූ ධර්මපාල ව්‍යාපාරය නැවත මතුවීමකැයි ගුණදාස අමරසේකර මහතා කියා ඇත. එහෙත් එයට ඊටත් වඩා අතීතයක් ඇත. පනස්හයේ දරුවෝ දේශනයෙහි දී මා පෙන්වා දී ඇති පරිදි 1956 යනු යටත්විජිත විරෝධී අරගලයේ එක් අදියරක් වෙයි. අප බ්‍රිතානි යුගයට පමණක් සීමාවුව ද පනස්හයේ ඉතිහාසය 1817-18 කරා දිවයයි. බ්‍රිතානීන්ට ගිවිසුමකින් රට බාරදීමෙන් පසුව සුද්දෝ දින කිහිපයකින් ම ගිවිසුම කැඩූහ. 1817-18 බ්‍රිතානීන්ට එරෙහිව කරන ලද පළමු නිදහස් අරගලය විය. ඉන් පසුව බ්‍රිතානීහු ඌව වෙල්ලස්ස ප්‍රදේශය ජනශූන්‍යකර සිංහලයන් අමානුෂිකව ඝාතනයකර සිංහල නායකත්වය මුළුමනින්ම මෙන් වැනසූහ. ඉතිරිකරගත් නායකයන්ට හා තවත් අයට වරප්‍රසාද දී ඔවුන් තම නියෝජිතයන් බවට පත්කළා පමණක් නොව අපේ නායකයන් බවට ද පත්කළහ. එදා සිට අපට ඇත්තේ බ්‍රිතානීන් විසින් පත්කරන ලද නායකත්වයකි. 1848 වන විට ද අපට අපේ සම්ප්‍රදායික නායකයෝ නො සිටියහ. බ්‍රිතානීන්ගේ කෲර මර්දනය හමුවේ සිංහලයන්ට පුරන් අප්පු හා ගොංගාලේගොඩ බණ්ඩා තම නායකයන් බවට පත්කරගැනීමට සිදුවිය. 1848 දී බ්‍රිතානීහු සිංහලයන් නැවතත් අමානුෂිකව ඝාතනය කළහ. ඉන්පසු සිංහලයන්ගේ නායකත්ව ප්‍රශ්නය ඔඩුදිවුවා පමණක් නොව මුළුමහත් ජාතියම පිරිහීමට ලක්විය. අපට තවමත් මේ අර්බුදයෙන් හරිහැටි ගොඩඑමට නොහැකි වී ඇත. තනිතට්ට ආදී චිත්‍රපටි මේ දීනත්වයෙහි සංකේතයක් පමණකි.

දහනවවැනි සියවසේ අගභාගයේ බෞද්ධ පුනර්ජීවනය යනු යටත්විජිත විරෝධී අරගලයේ සංස්කෘතික සංරචකය පෙරට පැමිණීමක් විය. එයට ගිහි නායකත්වය ලැබුණේ ධර්මපාලතුමාගෙනි. එහෙත් වැඩිකල් නොගොස් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යය යටතේ, ආගමින් බෞද්ධ වුව ද සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වූ ඕල්කට් බෞද්ධයෝ බ්‍රිතානීන්ගේ ආශිර්වාදය මැද ධර්මපාලතුමා නායකත්වයෙන් ඉවත්කර තුමුම සිංහලයන්ගේ නායකත්වයට පත්වූහ. අද ධර්මපාලතුමා සැමරුව ද මේ ඊනියා නායකයෝ එදා ධර්මපාලතුමාට රට එපාවන තුරු පහරදුන්හ. සංස්කෘතික යටත්විජිතවාදයට විරුද්ධව අපමණ සේවයක් කළ පියදාස සිරිසේන මහතා බටහිර නූතනත්ව සාහිත්‍යය හඳුන්වාදුන් මාර්ටින් වික්‍රමසිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර මහතුන් විසින් පරාජය කෙරිණි. බටහිර නූතනත්වයෙන් අපට අවශ්‍ය දේ ගැනීම යනු එළුහරකා හා මීහරකා එකට බැඳීමක් නොවන බව අද ද බොහෝ උගතුන් යැයි කියාගන්නා අයට නො තේරෙයි. චින්තනය යන සංකල්පය අවශ්‍ය වන්නේ එවැනි අවස්ථාවල දී ය. නායකයකු නැති පිරිසක් බවට පත්කර තිබූ සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයනට නැවතත් ජීවයක් ලබාදුන්නේ එල්. එච්. මෙත්තානන්ද මහතා යැයි කීම නිවැරදි ය. ආනන්ද විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් සේවයකරන කල ද එහි ඉගැන්වූ බුද්ධාගම පිළිබඳ විවේචනයක් ඒ මහතාට විය. ඕල්කට් බුද්ධාගම නමැති සංකල්පය නැතිව වුව ද ඒ මහතාට ඒ පිළිබඳ අවබෝධයක් තිබෙන්නට ඇත. ධර්මපාලතුමාගේ සමයේ දී මෙන් ම නැවතත් ඉස්මත්තට පැමිණියේ සංස්කෘතික සංරචකය ය. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමේ යෝජනාව පෙරට පැමිණියේ ය. බෞද්ධ කොමිෂන් සභා වාර්තාව එළි දැක්විණි. පනස්පහ වන විට නැවතත් යටත්විජිත විරෝධී සටන ඉදිරියට පැමිණියේ ය. මෙත්තානන්ද මහතා  පණස්හයේ පියා විය. එතුමා සමග බද්දේගම විමලවංශ, හේන්පිටගෙදර ඥානසීහ වැනි හිමිවරු ද, එන්. ක්‍යූ. දියෙස් මහතා වැනි ගිහි පිරිස් ද සිටියහ. එහෙත් එයට නායකයකු නැති විය. නායකයකු සොයමින් සිටි පනස්හයට බණ්ඩාරනායක මහතා ලැබිණි. ඒ මහතා සමග පිලිප් ගුණවර්ධන මහතා ද විය. යටත්විජිත විරේධී අරගලයේ ජයක් 1817න් අවුරුදු එකසිය හතළිහකට පසු පළමු වතාවට ලබාගැනීමට ජාතික බලවේගවලට හැකිවිය. එහෙත් ඒ තාවකාලික එකක් විය. නැවතත් විජාතික බලවේග බලය ලබාගත්තේ ය. ධර්මපාල යුගයේත් 1956ත් ජාතික බලවේගවලට තමන්ගේ ම මතවාදයක් නැතිවිය. එහෙත් අද එසේ නො වේ.  ජාතික මතවාදයක් පසුගිය අවුරුදු විස්සක පමණ කාලයක් තිස්සේ සුළුවෙන් නමුත් ගොඩනැගී ඇත. පනස්හයේ දරුවෝ මේ මතවාදයෙන් සන්නද්ධ වී සිටිති. ජනාධිපතිවරණයක් නමින් මේ කෙරීගෙන යන්නේ 1817 සටනම ය. ජාතික බලවේගවල නායකත්වයට  මහින්ද රාජපක්ෂ මහතා පත් වී ඇත. කුමාරතුංග මහත්මිය බණ්ඩාරනායක මහතාගේ හා මහත්මියගේ ජෛවීය දරුවකු වුව ද දේශපාලන දරුවෙක් හෝ පනස්හයේ දරුවෙක් හෝ නො වෙයි. මේ සටනේ ද අඩු ලුහුඬුකම් ඇත. කුමාරතුංග මහත්මිය ඇතුළු විජාතික බලවේග නොයෙකුත් බාධා ඇතිකරනු ඇත. ඒ බාධා මැඩගෙන ඉදිරියට යෑම පනස්හයේ දරුවන්ගේ කාර්යය වෙයි.

© Prof. Nalin De Silva